# මා බැහැදැක්මට ගිය කිරි ඉබ්බං දෙනියේ මහරජතුමා



**මේ සමස්ථ පසුබිම කෙරෙහිම අවධානය යොමු කිරීමේදී 'සිරි රජ සිරි' හි වටිනාකම මට තදින් දැනෙයි. එක් පරම්පරාවකට මගහැරුණු සුන්දරත්වය ඉදිරි පරම්පරාවකට හෝ ලබාදීමට නිර්මාණකරුවන් සිතා බැලිය යුතු සමය එළඹ ඇත. සෝමරත්න දිසානායක යන ගමන්මග මා ගරු කරමි. ඒ සිනමා කරුවකු ලෙසට වඩා කතා කරුවකු ලෙසිනි.**

වෙලාව සවස 2.55 යි. මා චැපල් වීදියේ කොනක කාරය තුළ සිරවී ඇත. සෙනසුරාදා දිනක මෙවන් තදබදයක් වෙතැයි කිසිවිටක නොසිත මගේ අතපසුවීම හේතුවෙන් සවස 3.00 ට චිත්‍රපටය ඇරඹීමට පෙරාතුව ශාලාවට යාමට සිදු නොවනු ඇත. ඕනෑම තැනකදී වේලාවට වැඩ නොකිරීම නොරුස්සන මගේ යටිසිත මෙසේ ප්‍රාර්ථනය කරයි. "අනේ, මොකක්හරි වෙලා පටං ගන්න එක පරක්කු වෙන්න."

ඒ සිරි රජ සිරි ආරම්භය මඟ හැරීමට තිබූ අකමැත්ත, දුක නිසාවෙනි.

යාංතන් වාහන තදබදය මදක් ලිහිල්වන සේය. ඉවසීමේ ගුණාංගය වර්ධනය කර ගැනීමට යත්න දරන මට මෙය කදිම අභ්‍යාසයක් බඳුය.

දැන් වෙලාව 3.10 යි. 'අන්න ඇස්ට්‍රෝ තියටර් එක'. මේ අවට රථගාල් කිරීමේ ගැටළුවක් ඇති බව අසා ඇත. ක්ෂණයෙන් දුටු රථගාල් කිරීමේ ස්ථානයට මගේ රථය ඇතුලුකොට හැකි උපරිම වේගයෙන් ශාලාව වෙතට දිව ගියෙමි. ඉදිරිපිට පිරිසක් කිසිඳු කලබලයකින් තොරව සිටිනු පෙනෙයි.

'ඕ..... හොඳ වෙලාවට පටංගන්ඩ පරක්කුවෙලා' ප්‍රවේශපත්‍රය අතටගෙන ශාලාව තුළට වේගයෙන් ඇඳුනෙමි.

නිවේදකගේ හඬ ශාලාව පුරාවට දෝංකාර දෙයි. ඔහු කුමක් කියන්නේද යන්න ගැන මා තුළ කිසිඳු අවධානයක් යොමු නොවින. ඒ අසුන් ගැනීමට සුදුසු තැනක් සෙවීමට මා දෑස් මෙන්ම මනස ද ඒ මේ අත විපරම් කල නිසාවෙනි. අවසානයේ ඉතා හොඳින් දර්ශනයවන තැනක අසුන් ගැනීමට ලැබීමත් සමඟම සහනදායී බවක් ශරීරය පුරා දිව ගියේය. අඳුරු ශාලාව පුරාවට හිස කරකවා විපරම් කොට හරි බරි ගැසී සැහැල්ලු වීමෙන් අනතුරුව නිවේදකගේ වදන් කෙමෙන් තේරුම් ගැනීමට හැකි වන්නාසේය.

විනාඩි කිහිපයක් පුරාවට චිත්‍රපටය පිළිබඳව නිවේදක කතා කරනු ඇසෙයි. "මේ දැවැන්ත චිත්‍රපටය...." "මේ සාර්තක චිත්‍රපටය" යනාදී වන් ඔහුගේ මුවින් නැවත නැවතත් පිට වන්නේය.

මගේ මුවතුළ නිහඬ වදන් පෙළක් ඉබේම දිග හැරින. "මොනවද මේ කියවන්නේ.... දැං ඇති... චිත්‍රපටය සාර්ථකද නැද්ද, දැවැන්තද නැද්ද කියන එක බලල ඉවරවෙලා අපි තීරණය කරන්නං"

නිර්මාණයක් රසවිඳීමට පෙරාතුව රසිකයින්ට ඒ ගැන හැඳින්වීමක් කරලීම හොඳය. එහෙත් එහි සාර්ථක අසාර්ථක භාවය තීරණය කිරීම ප්‍රේක්ෂක හෝ රසික තුළට ඉතිරි කළ යුත්තක් යැයි සිතමි.

මොහොතකින් නිවේදකගේ ඇරයුමින් රේණුකා බාලසූරිය මහත්මිය (චිත්‍රපටයේ නිශ්පාදිකාව) අපව ඇමතීම ඇරඹිනි. ඇය ඉතා දිගු නාමාවලියකට තුති පුදයි. එය සිදුකල යුත්තකි. මොහොතකින් ඇයගේ මුවින් මෙවන් වදන් පෙළක් පිටවුනි.

"මේ චිත්‍රපටය බලද්දි ඔබේ දෑසට කඳුලක් උණනවා. ඒකට ලජ්ජ වෙන්න එපා'

මේ වාක්‍ය මට දරාගත නොහැකි වදන් පෙළක් නිසාදෝ මගේ මුළුශරීරයම ඊට ප්‍රතික්‍රියා කරන්නා සේය. ඒ මන්ද ? චිත්‍රපටය නැරඹීමට පෙරාතුව නිර්මාපකයින්ගේ මුවින් මෙවන් වදන් පිටවීම උචිතදැයි මා තුළ ප්‍රශ්නාර්තයක් පැණනගින බැවිනි.

නිර්මාණයක් රසවිඳීමේදී ඒ ඒ පුද්ගලයින්ගේ අත්දැකීම් හෝ අනෙකුත් කාරණා මත රසිකයින් විවිධ ආකාරයෙන් රසවිඳිනු ඇත. එහෙත් නිර්මාපකයන් විසින් රසිකයින් වෙත ඊට හැඬීමට හෝ සිනාසීමට සූදානම් වෙන්නැයි කීම කෙතරම් උචිතදැයි මා නොදනිමි. නැතහොත් නිර්මාපක විසින්ම මෙය ප්‍රබුද්ධ නිර්මාණයක් යැයි කීම උචිතදැයි නොදනිමි. එය ප්‍රේක්ෂක අප තීරණය කලයුත්තක් සේ මට හැඟෙයි.

මේ කරුණ මෙසේ සනිටුහන් කරණුයේ මීට පෙර වතා කීපයකදීම මෙල්බර්න් නුවරදී ඊට සමාන අවස්ථා කීපයකටම මුහුණ පා ඇති හෙයිනි.

මොහොතකින් එතුමිය විසින්ම ලාංකික චිත්‍රපට කර්මාන්තයේ වත්මන් තත්ත්වය ගැන ඉතා වටිනා අදහස් පෙළක් ඉදිරිපත් කරයි. ඒ ඔස්සේ ජැක්සන් ඇන්තනීගේ "අබා" චිත්‍රපට නිර්මාණය ලාංකික සිනමාවේ සුබ ලකුණක් වන්නේ කෙසේද යන අයුරු සරලව විග්‍රහ කරයි. අවසන මේ ප්‍රේක්ෂක පිරිසට 'අබා' ද නැරඹීමට ඇය ආරාධනා කරයි.

මේ සිදුවීම් පෙළ මා තුළ ඉතාම සතුටු හැඟීම් ධාරාවක් ගලායාමට තුඩු දුන්නේය. අබා චිත්‍රපටයට ඇගේ කිසිඳු සම්බන්ධයක් තිබේද නොතිබේද මා නොදනිමි. එහෙත් සැබෑ ලෙසම කලාවට ආදරය කරන්නකුගේ පැතිකඩක් ඇය තුළින් විද්‍යාමාන වන්නාසේය. සොයුරු කලාකරුවකුගේ සාර්ථක නිර්මාණයක් අගයකොට කතා කරන්නා සේම ඊට ප්‍රේක්ෂකාගාරයක්ද ගෙන ඒමට වෙර දැරීම සැමවිටම වෘත්තීය ප්‍රවීණ කලාකරුවන් අතින්ද සිදු නොවන්නක් බව මා අත්දැකීමෙන් දනිමි. අවංක චේතනාවකින් මෙවන් උත්සහයක් දැරීම ඉතා උසස් ගුණයක් යැයි මට හැඟෙයි. ඇයගේ වදන් මෙසේ අවසන් කරයි. 'චිත්‍රපටය නැරඹීමෙන් පසුව ඔයාලට ඉඩකඩ ලැබෙන විදියට මට කතාකරල යන්න. මං ඉන්නවා දොරටුව ලඟ' ඒ ඇය ඉතාම නිහතමානීව කී වදන් පෙළකි.

නැවතත් පැමිණෙන නිවේදක දුටු සැනින් මා තුළ තරමක අපහසුතාවයක් හටගැනින. ඒ මන්දැයි විග්‍රහ නොකරමි. කෙසේ වෙතත් මොහොතකින් ඔහු මුවින් ඉතාම වටිනා වදන් පෙළක් ගලා එයි. එය කැටිකොට අදහස මෙහි ලියා දක්වමි.

හුදෙක් දුර්වල හාස්‍ය රැල්ලට බරවූ ප්‍රේක්ෂක රසඥතාවය මොට කරවන සුළු දර්ශන වලට අතුරු සිදුරු නැතිව ශාලා පිරී යන මුත් අද මෙවන් චිත්‍රපටයකට සීමිත පිරිසක් පමණක් සිටින බව මගේ හිස නැවතත් කාරණයෙන් කැරකින. ඔහු කියන දෙය සැබෑය. කලාමාධ්‍යයන් රැසකට ගරුකරන, ලැදි පුද්ගලයෙකු වශයෙන් කලක් මුලුල්ලේ සිට මා දකින භයංකාර අඳුරු අනාගතය පැමිණි ඇත්තා සේ මගේ ශරීරයට කිලිපොලා යයි. බිරිඳත් දරු දෙදෙනාත් උණ රෝගයෙන් පෙළෙන මෙවන් මොහොතක මා පමණක් චිත්‍රපටය නැරඹීමට පැමිණීම ගැන සිතේ වූ චකිතයට සාධාරණයක් වූ සේය. කතා බතා සියල්ල හමාරය. දැන් චිත්‍රපටය.

මා මේ කරනුයේ සිනමා විචාරයක් නම් නොව, චිත්‍රපටයේ සිනමාරූපී බව හෝ අනිකුත් තාක්ෂණික අංශයන් ගැන විශිෂ්ඨ තලයක තැබිය හැකි නිර්මාණයක් සේ මා සිරි රජ සිරි නොදකියි. එහෙත් මා පෙරකී භයංකාර අඳුරු අනාගතයට සිරි රජ සිරි තුළින් දෙන ආලෝකය ගැන කතිකාවතක් ඇතිකරලීම අවශ්‍යයැයි මම පිළිගනිමි.

' සිරි රජ සිරි' මා වින්දෙමි. සෝමරත්න දිසානායක ' සිරි රජ සිරි' කතා සාරය තුළින් මගේ නෙතේ කඳුලක් පිටතට ඇද දැමීය. හදවත මොහොතකට නිසල කලේය. හදවතෙහි යම් අයුරක තෙතමනයක් ඇති ඕනෑම කෙනෙකුට විවිධ වූ අයුරින් ' සිරි රජ සිරි' සමීප නොවූයේ නම් පුදුමය. එම හෝරා දෙකකට සමීප කාලය මා මව් බිමට ගෙන ගියේය.

### වත්මන් ලාංකික නිර්මාණ ගැන අවධානය

අද ඔබ රසවිඳින නිර්මාණ අතරෙහි දැඩි ලෙස ඔබව ඩැහැගෙන සිටිනුයේ ටෙලිනාට්‍ය මධ්‍ය නොවේද? ඇතැම් ඒවාට නිර්මාණ යන ගරුකටයුතු වචනය භාවිතා කිරීම පවා උචිතදැයි මා නොදනිමි. ලාංකික භූමිය තුළ දිනකට හෝරා ගණනාවක් මිනිසුන් වෙත කඩා පනිමින්ද මෙවන් විදෙස් භූමිවල ලාංකික ජනසමාජයන් සොයා ගොස් වැළඳගනිමින්ද සිටින මේ නීරස ටෙලිදර්ශන සමස්ථ සමාජයක් අගාදයට ඇද නොදමයිද ? ඩොලරයේ ලාභය තකා ටෙලිනාට්‍ය මංකොල්ලයේ ප්‍රධාන කොටස්කරුවන් වන ශ්‍රී ලාංකික වෙළඳසැල් හිමියන් මෙයට වගකිව යුත්තෝද?

ශතවර්ෂ ගණනාවක් ඔස්සේ මනුෂ්‍ය සංහතියක් පෝෂණය කරලීමට උරදුන් නාට්‍ය කලාව නම් මාධ්‍යයට ලාංකික බිම තුළ අත්ව ඇති ඉරණම කුමක්ද? ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකවද විශාල කඩාවැටීමකි.

සිනමාව ගීතය ආදී ඇතැම් අංශයන්හි ප්‍රමාණාත්මකව වර්ධිත ස්වභාවයක් දිස් වුවද මානුෂික සබඳතා හෝ මානුෂිකත්වයේ විවිධ කෝණයෙන් විශ්ලේෂණය වන හෝ ගුණාත්මක භාවයෙන් පිරී නිර්මාණ මුණගැසෙනුයේ කෙතරම් අතලොස්සක්ද? සාහිත්‍ය කලාවට අත්ව ඇති ඉරණම කුමක්ද ?

මා ඉදිරිපිට රූපමාන වනුයේ ඒ අඳුරු අනාගතයයි. මිනිස් යන්ත්‍රයන්ගෙන් පිරී අනාගතයයි.

### ඍණ මානසිකත්වය

අපිට දකින්නට අසන්නට ලැබෙන දර්ශන හෝ නිර්මාණයන්ගෙන් බහුතරයක් අපව ඇද දමන මානසිකත්වය කුමක්ද ? අපේ රටේ (මව්බිමේ) තත්වය තීරණාත්මකය. සමාජය සංස්කෘතිය විශාල උවදුරකට ලක්වූ සේය. ගැටලු රැසකි. ඉඳින් ඒ ඇසුරෙහි පය ගසා සිටින නිර්මාණකරුවන් ඒ පසුබිම ගැන කතා නොකර කොහොමද? තර්කයක් නැත. යුද්ධය, භීෂණය, මංකොල්ල, දූෂණ ගැන විවිධ කෝණයන්ගෙන් නිර්මාණ කරලීම නිවැරදි ද? තර්කයක් නැත.

එසේනම් ගැටලුව කොතැනද ? සමස්ථ භූමියේම වැඩි ප්‍රතිශතයක් ඉහත කී තත්වයන්ගෙන් බැට කමින් දිනෙන් දින ඍණ මානසිකත්වයටම ඇද වැටෙමින් සිටිනු සේය. එම පිරිසට නිර්මාණ තුලින් (වැඩි ප්‍රමාණයක්) තව දුරටත් ඍණ තලයටම කිඳා බැසීමට අවශ්‍ය ඍණ මානසිකත්වයම ලබා දීම උචිතද? පවතින වාතාවරණයන් ගැන බුද්ධිමය සංවාදයක් අවශ්‍ය බව සැබෑය. එහෙත් කලා කරුවාගේ වගකීම ඉන් ඔබ්බට යා යුතුය.

අද ලාංකික පොලිස් නිලධාරියකු කියූ සැනින් වැඩි දෙනෙකු තුළ මැවෙන රූප මොනවද ? පගා කාරයෙක්, දූෂිත පුද්ගලයෙක්, අසාධාරණයේ පැතිකඩක්. දේශපාලඥයෙක් කියූ සැනින් මැවෙන රූප මොනවද? උසස් අධ්‍යාපනයෙන් තොර භීෂණයේ සහ දූෂණයේ හරස්කඩක්. මේ තත්වය නිර්මාණය වූයේ කෙසේද? ඒ ඒ නාමික චරිතයන්ගේ වැරැද්ද සේම අප දකින අසන කියවන බොහෝමයක් කෘතීන් තුළින් අපේ මනසේ ඒ රූප ඇද ඇති නිසාය.

පසුගිය දශකය පුරාවට මා නැරඹි චිත්‍රපට වැඩිගණනක ලාංකික සමාජයේ අඳුරු පැතිකඩයන් පමණක් විදහාලීය. ඒ නිර්මාණකරුවන්ගේ හද තුළින් නැගෙන දෝංකාරය නිසා විය හැකිය. ඇතැම්විට ජාත්‍යන්තර තලයේ ප්‍රචලිත වීමේ අදිටන නිසා විය හැකිය. කුමන හේතුවක් නිසා හෝ එය සිදුවිය.

### ධන මානසිකත්වය

මේ සමස්ථ පසුබිම කෙරෙහිම අවධානය යොමු කිරීමේදී 'සිරි රජ සිරි' හි වටිනාකම මට තදින් දැනෙයි. එක් පරම්පරාවකට මගහැරුණු සුන්දරත්වය ඉදිරි පරම්පරාවකට හෝ ලබාදීමට නිර්මාණකරුවන් සිතා බැලිය යුතු සමය එළඹ ඇත. සෝමරත්න දිසානායක යන ගමන්මග මා ගරු කරමි. ඒ සිනමා කරුවකු ලෙසට වඩා කතා කරුවකු ලෙසිනි.

පවතින දේශපාලනික සංස්කෘතික වාතාවරණය ගැන විද්වත් කතිකාවතක් බිහිකලයුතු බව සැබෑය. එසේම මනුෂ්‍යයා තුළ ඇති සුන්දරත්වය තුළින් මිනිසා පෝෂණය කළ හැකි අයුරේ සුන්දර පාර්ශවයක්ද වර්ධනය යුතු නොවේද? පෙර වූ සමබරතාවය දැන් බිඳී ඇත.

ඉදිරියට අපේ රට තුළ ධන මානසිකත්වයක් වගාකරලීමට උත්සහ දැරුවොත් කුමක් වෙයිද? පොලිස් නිලධාරියකුට, දේශපාලඥයකුට ඉතා හොඳ උසස් අධ්‍යාපනයෙන් හෙබි, නීතිගරුක, සුන්දර රූප මවමින් ඔවුනොවුන්ගේ ක්‍රියාකලාපයන් ගැන ඔවිනටද දෙවරක් සිතා බැලිය යුතු ආකාරයට රූප මැවීමෙන් වරදක් වෙයිද? එය සැමදා අපි දකින හීනයක් පමණක්ද? කලාකරුවා සතු කාර්ය භාරය කුමක්ද? රටක වර්ධනයට කලාකරුවාට දායකවිය හැක්කේ කෙසේද? නිර්මාණ ලෝකයේ සියල්ලෝම අවධානය යොමු කලයුතු කල් එළඹ ඇත.

මේ අදහස් වලට සම්බන්ධ වීමට හැකි අයෙක් වෙතොත්, එකඟව හෝ විරෝධව, මා ආදරයෙන් ඇරයුම් කරමි.

### නිර්මාණ කරුවනට

ඕස්ට්‍රේලියාව වූ කලී ශ්‍රී ලාංකික නිර්මාණ ක්ෂේත්‍රයේ විවිධ මාධ්‍යවල නිරත වූ ප්‍රවීණයන් රැසකගෙන් සමන්විත භූමියකි. මේ පිරිසට ලෝක නිර්මාණ සාහිත්‍ය, සංගීතය, චිත්‍රපට ආදිය වඩාත් විවෘත්තය ලංකාව තුළ ජීවත් වන්නකුට තිබෙන්නා වූ මානසික පීඩනයන් වෙනස් ආකාරයෙන් දැනීමට පුලුවන. එහෙයින් මේ පිරිසට කලහැකි කාර්ය භාරය කුමක්ද? කිනම් බලපෑමක් කල හැකි ද? නිහඬව සිටීම අපට කල හැකි පහසුම කාර්යය වනු ඇත. එසේ කිරීම උචිතද?

දිනකින්, වසරකින් සැබෑ නොවන සිහිනයක් සැබෑ කරගැනීමේ කොටස්කරුවන් වීමට අපට නොහැකිද?

රසිකයිනට

කොටස් සිය ගණනින් විකාශණය වන මෑ රහිත ටෙලි දසුන් ඔබ රසවිඳීයිද? අර්ථ විරහිත සංදර්ශණ, වේදිකා හාස්‍ය දර්ශන වල ඔබ වැඩි වැඩියෙන් ගැටෙයිද?

ඇතැම් විට ඔබට 'මා ඉන් වින්දනයක් ලබමි' යන් ආකල්පය තිබීමට හැකිය. එහෙත් ඔබේ මනසේ බුද්ධිමය රහස්වාදයකට තුඩුදෙන සෛලයන් අජීවී වී ඇති බව ඔබ දන්නෙහිද ? ඔබේ සාලයේ ඔබ වටා අසුන්ගෙන සිටින දූ දරුවනට ඔබ සිදුකරලන අපරාදයේ ඵල පසු පරම්පරාවල සාමාජිකයන් අත්විඳිනු නොඅනුමානය. මීට වගකිවයුතු පාර්ශවයන් බොහෝය. ටෙලි දර්ශන වෙලෙන්දන්, ඊට නන් අයුරින් දායකවන්නන්, ඒවා ජනතාවට මුදාහරින ව්‍යාපාරිකයින් ආදීන් සේම නිවසේ ඔබේ රූප පෙට්ටිය තුළ දර්ශනය කරවන ඔබද ප්‍රධාන කොටස් කරුවෝ වනු ඇත.

### 'සිරි රජ සිරි' සංවිධායකයින්ට තුත

මේ සංවිධායකයින්ම මීට පෙර 'සංකාරණ චිත්‍රපටය සංවිධානය කලා දුටිමි. හුදෙක් ආර්ථික වාසිම තකා සංවිධායක කටයුතු කරලන පිරිස බහුල තැනක ඔබ මේ කරලනුයේ සත් කාර්යයකි. මිනිස් වර්ගයා ක්‍රමයෙන් අගාදයටම ඇදහෙළන දෑ ප්‍රදර්ශනයෙන් තොරව මෙවන් සත් ක්‍රියාවන්ට උනන්දුවන ඔබට පූර්ණ ප්‍රණාමය.

කුසුම්සිරි ලියනආරච්චි